Prepared by- ඩයනා පුෂ්පරාණි මිය

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

## 6.3 නවරාත්‍රී උත්සවය

අස්වනු නෙලන ද්‍රවිඩ ජනයාගේ හින්දු ආගමික උත්සවයක් ලෙස නවරාත්‍රී උත්සවය හැඳින්විය හැක.අස්වනු නෙලන කාලයේදී මෙය පවත්වන අතර රාත්‍රියේ දෙවියන් වෙනුවෙන් පවත්වන බැවින් නවරත්‍රී ලෙස නම් කොට ඇත.දුර්ගා දේවිය ,ලක්ෂ්මී දේවිය,සරස්වතී දේවිය ප්‍රධාන කොට ගෙන දින 03 බැගින් දින 09ක් මෙම උත්සවය පවත්වයි.දින09න් පසු 10 වන දිනය “ විජයදාම් ” යනුවෙන් පූජාවක් පවත්වයි.අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම සංකේතවත් කරමින් අවු 03 න් පහළ දරුවන්ට අකුරු කියවීම සිදු කරයි. තවද නවරාත්‍රී දින රාත්‍රී පූජාව පවත්වන අවස්ථාවේ ඒ ඒ කටයුතු වල නියැළෙන්නවුන් තමාට අදාල උපකරණ අතේ තබා පූජාව පැවැත්වීම සුවිශේෂී ලක්ෂණයකි. නිදසුනක් ලෙස අධ්‍යාපනයේ නියැළෙන්නන් තම පොත් ,පෑන් ආදිය රැගෙන පූජාව පැවැත්වීම.

<u>පූජාව පැවැත්වීමට හේතු</u>

දෙවියන් පිදීමට ,සශ්‍රීකත්වය හා සෞභාග්‍ය ප්‍රාර්ථනා කිරීම,අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම.

<u>ආගමික පසුබිම</u>

දුර්ගා,ලක්ෂ්මී,සරස්වතී දෙව්වරුන් මුල්කරගනිමින් මෙම උත්සවය පවත්වන බැවින් ආගමික පසුබිම මනාව දිස්වේ. ප්‍රථම දින 03 දුර්ගා දේවිය මුල්කරගනිමින් පුද පූජා පැවත්වේ.මෙම උත්සවයේදී දුර්ගා දේවිය කාලිඅම්මා හා පාර්වතී දේවිය ලෙස පුද ලබයි.ඇය බලයට හා ශක්තියට අධිපති දේවිය වැවින් මෙකී බලය හා ශක්තිය ජනයාට ලබාදෙන්නට යයි පතමින් පූජාව පවත්වයි.

ඊලග දින 03 ලක්ෂ්මී දේවිය උදෙසා පූජාව පවත්වයි.ධනයට හා සමෘද්ධියට අධිපති දේවිය ලෙස හින්දූන් විසින් සලකනු ලබයි.එබැවින් ධනය හා සමෘද්ධිය ලබාගැනීමේ අපේක්ෂාවෙන් පූජා පවත්වයි.

අවසාන දින 03 සරස්වතී දේවිය උදෙසා පූජාව පවත්වයි.කලාවට අධිපති දේවිය සරස්වතී දේවිය බැවින් කලාවේ දියුණුව මුදුන් පමුණුවා ගැනීම උදෙසා පූජාව පවත්වයි.

<u>නර්තන,ගායන,වාදන</u>

මෙයට ආවේනික වූ විශේෂ නර්තන නොමැති බැවින් ද්‍රවිඩ ජනයාට අවේනික වූ නැටුම් භාවිතා කරයි.තේවාරම්,නම් ගායනා විශේෂයක් වාදනය සඳහා කවිල් බෙරය යොදා ගනී.

සැරසිලි

**හින්දු කෝවිල් සැරසීම ,නිවෙස් සැරසීම,**

**කෝවිල් සැරසීම සඳහා කෙසෙල් කැන් සහිත කෙසෙල් ගස් යොදාගනී, නිර්මාණ සහිත ගොප් කොළ රැන් යොදා ගනී.**

**නිවාස සැරසීමේදී තට්ටු 09 කින් යුත් ආසනයක් සාදයි.දේව රූප,සෙල්ලම් බඩු වලින් තට්ටු 08 ක් අලංකාර කරන අතර ඇට වර්ග 09ක් පැළවෙන්නට තබා එම පැළවලින් අවසාන තටටුව සරසයි.මෙම තට්ටු 09 "කොලු " ලෙස හඳුන්වයි.**

පැවරුම

**පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න**

| නවරාත්‍රී උත්සවය පැවැත්වීමට හේතු | පුද ලබන දෙවිවරු | චාරිත්‍ර විධි | නර්තන ,ගායන,වාදන | සැරසිලි | සංස්කෘතික වටිනා කම |
|---|---|---|---|---|---|
| | | | | | |